# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2126/40 – 2019 ජුනි 06 වැනි බ්‍රහස්පතින්දා – 2019.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පැපිලියාන නමැති ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක සීඕ/ඩීඑස්ඕ/2017/750 හා 2018.04.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – වැටකෙයියාගහ කුඹුර හෙවත් නින්දේ කුඹුර, වැඩවසම් මාදංගහ කුඹුර හෙවත් පේදුරුවේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0253

උතුරට: කො. 9623 මූලික පිඹුරේ කැබලි අංක 19 සහ 22; නැගෙනහිරට සහ දකුණට: කො. 9623 මූලික පිඹුරේ කැබලි අංක 22; බටහිරට: කො. 9623 මූලික පිඹුරේ කැබලි අංක 22, යූරෝ ස්කෑන් පුද්ගලික සමාගම සහ කො. 9623 මූලික පිඹුරේ කැබලි අංක 19.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය : 4-3/10/2017/එල්ආර්බී/368.
2019 මාර්තු මස 16 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

06 - 591